# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2337/17 - 2023 ජුනි මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2023.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ඇ ව්‍යවස්ථාව සමග කියවිය යුතු බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතන වල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 වන වගන්තිය යටතේ හා 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥාපනතේ 184(1අ) වන වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය**

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ඇ ව්‍යවස්ථාව සමග කියවිය යුතු බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතන වල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 වන වගන්තිය යටතේ හා 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥාපනතේ 184(1අ) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහරගම නගර සභාව හා මහරගම නගර සභාවේ සභාපති වශයෙන් කටයුතු කිරීමේදී ඉහත කී බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 වන වගන්තිය යටතේ සඳහන් වැරදි ක්‍රියා හා 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184 වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදු කර තිබේද යන්න පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2313/41 හා 2023 ජනවාරි මස 04 වන දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් පත් කරන ලද විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු චන්ද්‍රදාස නානායක්කාර මැතිතුමාගෙන් සැදුම්ලත් ඒක පුද්ගල පරීක්ෂණ සභාවෙහි පරීක්ෂණ කාලය 2023 ජුනි මස 30 වැනි දින දක්වා මෙයින් දීර්ඝ කරනු ලබන බව නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී පීඑච්ඩී,
එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝර්ස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2023 ජුනි මස 15 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 06 - 0167